NEWS RELEASE

UNITED NATIONS HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

# ශ්‍රී ලංකාව: වහල් භාවයේ ශාපය අවසන් කිරීමට 'සියල්ලන් ඇතුළත් සමාජයක්' එක්සත් ජාතීන්ගේ විශේෂඥයා ඉල්ලා සිටී

කොළඹ (2021 දෙසැම්බර් 3) සමකාලීන වහල් භාවයේ විවිධ ආකාරයන්ට මුහුණ දීමට ප්‍රබල නීති පද්ධතියක් ශ්‍රී ලංකාව සතුව පවතී. සේවා නියුක්තියේ අවම වයස 14 සිට 16 දක්වා ඉහළ දැමීම සහ ළමා ශ්‍රමයෙන් නිදහස් කලාපයක් පිහිටුවීම වැනි වෙනත් ක්ෂේත්‍රවලද ප්‍රගතියක් අත් කර ගනිමින් සිටී. එසේ වුවත් ශ්‍රී ලංකාව සමාජයේ සියලු අංශ වඩාත් හොඳින් ඇතුළත් කර ගන්නා සහ වැළඳ ගන්නා සමාජයක් බවට පත්වීමට නම් කුලය පදනම් වෙනස් කොට සැලකීම සහ සමහර අවස්ථාවල බලහත්කාර ශ්‍රමය සහ දාස භාවය විය හැකි ශ්‍රම සූරාකෑම ජය ගත යුතුයැයි එක්සත් ජාතීන්ගේ විශේෂඥයා අද පැවසුවේය.

තමා ශ්‍රම සූරාකෑම සහ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, වයස, වාර්ගිකත්වය, කුලය, පංතිය සහ වෙනත් හේතූන් මත වෙනස් කොට සැලකීම අතර ඇති සම්බන්ධතා ගැන උනන්දු වන බව දාස භාවයේ ආකාරයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ටොමොයා ඔබොකටා පැවසුවේය.

''බලහත්කාර ශ්‍රමය, ළමා ශ්‍රමය සහ වෙනත් ආකාරයේ සූරාකෑමේ භාවිතාවන්ට කේන්ද්‍රීය වන දිගටම පවතින වෙනස් කොට සැලකීමේ ආකල්ප සහ භාවිතා අවසන් කිරීමට උචිත කාලය පැමිණ ඇතැ''යි ශ්‍රී ලංකාවේ දින අටක සංචාරයෙන් පසුව කොළඹ දී ජනමාධ්‍යය ඇමතූ ඔබොකටා පැවසුවේය.

''සියල්ලන් ඇතුළත් කර ගැනීම දක්වා වර්ධනයවීමට අවශ්‍ය සමාජයකට, සියල්ලන් සඳහා සමකාලී වහල් භාවය අවසන් කිරීම සඳහා ගුණාත්මක අධ්‍යාපනය, පුහුණුව සහ යහපත් වැඩ අත්‍යවශ්‍ය ය. ආණ්ඩුව ඉතාමත් කොන් කරන ලද අය ඇතුළත් සියලු ජනතාවට සවන් දිය යුතුය. සාධනීය වෙනසක් කුළු ගැන්වීමට කුලය පදනම් වෙනස් කොට සැලකීම වැනි සංවේදී කරුණු ගැන නිහඬතාවය බිඳ දැමිය යුතුය.''

ඔබොකොටා සිය සංචාරයේ දී ආණ්ඩුවේ, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ, සිවිල් සමාජ සංවිධානවල, වෘත්තීය සමිති, සහ එක්සත් ජාතීන්ගේ නිලධාරීන් මෙන්ම මානව අයිතිවාසිකම් ආරක්ෂකයන්, ශාස්ත්‍රඥයන්, සංක්‍රමණික සේවකයන් සහ ශ්‍රම සූරා කෑමේ වින්දිතයන් හමු වූයේය. ඔබොකොටා කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇඟලුම් කම්හල් දෙකකටත් මහනුවර සහ තේ වතු කීපයකටත් ගියේය.

''මම කොන් කිරීම, වෙනස් කොට සැලකීම, වැඩ කිරීමේ සූරා කෑමේ තත්වයන් සහ ජීවත් වීමේ දුක්ඛිත තත්වයන්ගෙන් පීඩාවට පත් මලයාහ දෙමළ වැසියන් සියැසින්ම දුටුවෙමි.'' විශේෂඥයා පැවසුවේය.

ගෘහස්ත වැඩවල සහ නොවිධිමත් ආර්ථිකයේ සහ සේවා කර්මාන්තයේ වෙනත් ක්ෂේත්‍රවල ළමා ශ්‍රමය යොදා ගැනීමේ අවස්ථා පිළිබඳ වාර්තා ද ඔබොකොට ට ලැබිණ. ඔහු දිගටම පවතිනස ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය අසමනාතාවය සහ කාන්තාවන්ට බලපාන වෙනස් කොට සැලකීම පිළිබඳව තම කනස්සල්ල ද පළ කෙළේය.

ග්‍රාමීය ප්‍රදේශවල දරිද්‍රතාවයෙන පෙළෙන කාන්තාවන් අසමාන ලෙෂ ඉලක්ක කර ගත් සහ බොහෝ විට ණයබර වැඩි කරවන ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රම බලවත් කනස්සල්ලට කරුණක් බව විශේෂ වාර්තාකරු පැවසුවේය. අඩු වැටුප් ශ්‍රී ලංකාවේ ඉහළ යන ජීවන වියදම හා නොගැලපෙන් බවද ඔහු කීවේය.

තේ වතු සහ ඇඟලුම් කම්හල් වැනි පුද්ගලික ව්‍යාපාරික ආයතනවල විශ්‍රාමික හමුදා නිලධාරීන් නිරන්තරයෙන් සේවයේ යොදා ගැනීම පිළිබඳ වාර්තා ද ඕබොකොටා ට ලැබී ඇත. සිවිල් සමාජයේ නියෝජිතයන්, මානව අයිතිවාසිකම් ආරක්ෂකයන් සහ වෘත්තීය සමිති සාමාජිකයන්ට නිතිපතා හිරිහැර කිරීමේ සහ තර්ජනය කිරීමේ සහ කොවිඩ් තත්වයට අදාල සීමා කිරීම් යෙදවීම හරහා රැස්වීමේ නිදහස සීමා කිරීම ඇතුළත් සිවිල් සමාජ අවකාශය සීමා කිරීම් ගැනද ඔහු දැනුවත් වූයේය.

සියලුම ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය අනන්‍යතා සහ ලිංගික නැඹුරුවකින් යුත් ලිංගික සේවකයන් වෙනස් කොට සැලකීමට සහ අපකීර්තියට මුහුණ දෙන අතර ඔවුන් නීතිය බලාත්මක කරන නිලධාරීන් විසින් මෙන්ම ලිංගිකව සූරා කෑමේ සහ අපහරණයට ලත්වීමේ අවදානමක් පවතී.

විශේෂ වාර්තාකරුගේ සංචාරයේ වාර්තාව 2022 සැප්තැම්බර් මස මානව අයිතිවාසිකම් කවුන්සලයට ඉදිරිපත් කරනු ඇත.

**අවසන්.**

**ටොමොයා ඕබොකොටා මහතා** (ජපානය) අන්තර්ජාතික සංවිධානය වූ අපරාධ, මිනිස් ජාවාරම සහ නූතන වහල් භාවය පිළිබඳ විශේෂඥතාවයක් ඇති අන්තර්ජාතික නීතිය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ විද්වතෙකි. ඔහු හේතු සහ එහි ආනිශංස ඇතුළත් සමකාලීන වහල් භාවයේ ආකාරයන් පිළිබඳ විශේෂ වාර්තාකරු වශයෙන් තම ධුර කාලය ආරම්භ කෙලේ 2020 මැයි මාසයේ සිට ය. ඔහු දැනට කීලේ විශ්ව විද්‍යාලයේ අන්තර්ජාතික නීතිය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ මහාචාර්යවරයා වන අතර කලින් බෙල්පස්ට් හි ක්වීන් විශ්ව විද්‍යාලයේ සහ ඩන්ඩී විශ්ව විද්‍යාලයේ ඉගැන්වූයේය. (ඒ සියල්ල මහා බ්‍රිතාන්‍යයේ එක්සත් රාජධානියේ සහ උතුරු අයර්ලන්තයේ ය.) ඔහුට අන්තර්ජාතික අපරාධ, මිනිස් ජාවාරම සහ අදාල පාර්ශ්වකරුවන් සමග නූතන වහල් භාවය පිළිබඳ ප්‍රශ්න ගැන වැඩ කිරීමේ පුළුල් අත්දැකීම් පවතී. මෙම මාතෘකා පිළිබඳව ඔහු විසින් ප්‍රකාශන විශාල සංඛ්‍යාවක් නිකුත් කර ඇත.

විශේෂ වාර්තාකරුවන් සහ ක්‍රියාකාරී කණ්ඩායම් යනු මානව අයිතිවාසිකම් කවුන්සලයේ විශේෂ ක්‍රියා පටිපාටි යනුවෙන් හැඳින්වෙන කොටසේ අංශයකි. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පද්ධතියේ ස්වාධීන විශේෂඥයන්ගේ විශාලතම ආයතනය වන විශේෂ ක්‍රියා පටිපාටි යනු ලොව සියලු ප්‍රදේශවල රටකට සුවිශේෂී වූ තත්වයන් හෝ තේමාගත ගැටලු ආමන්ත්‍රණය කෙරෙන කවුන්සලයේ ස්වාධීන තොරතුරු සෙවීමේ සහ අධීක්ෂණ යාන්ත්‍රණ සඳහා වූ පොදු නාමයයි. විශේෂ ක්‍රියා පටිපාටි විශේෂඥයන් ස්වේච්ඡා පදනමක් යටතේ වැඩ කරන අතර ඔවුන් එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලයට අයත් නොවේ. ඔවුන්ගේ වැඩ කටයුතුවලට වැටුපක් ලැබෙන්නේ ද නැත. කිසියම් ආණ්ඩුවකින් හෝ සංවිධානයකින් ස්වාධීන වන ඔවුහු පුද්ගල මට්ටමෙන් සේවය කරති.

**එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් දේශීය පිටුව: ශ්‍රී ලංකාව**

වැඩි විස්තර සහ මාධ්‍ය ඉල්ලීම් සඳහා සත්‍යා ජෙනිංගිස් මහත්මිය (satya.jennings@un.org) සම්බන්ධ කරගන්න

අනෙකුත් එක්සත් ජාතීන්ගේ ස්වාධීන විශේෂඥයින් සම්බන්ධයෙන් මාධ්‍ය විමසීම් සඳහා Renato de Souza (+41 22 928 9855 / renato.rosariodesouza@un.org), Jeremy Laurence (+ 41 22 917 7578 / jeremy.laurence@un.org) කරුණාකර සම්බන්ධ කරගන්න

එක්සත් ජාතීන්ගේ ස්වාධීන මානව හිමිකම් විශේෂඥයින් සම්බන්ධ පුවත් සඳහා Twitter@UN_SPExperts

අප ජීවත් වන ලෝකය ගැන සැලකිලිමත්ද?

එසේනම් අදම යමෙකුගේ අයිතිවාසිකම් වෙනුවෙන් නැගී සිටින්න

#Standup4humanrights

සහ වෙබ් පිටුවටත් පිවිසෙන්න http://www.standup4humanrights.org